සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

# බුද්ධ ධර්මය II
# பௌத்தம் II
# Buddhism II

※ පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා **අනෙක් ප්‍රශ්නයකට** ලකුණු 10 ක් ද බැගින් හිමි වේ.

---

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) කුඩා දරුවා තරුණයකු, වැඩිහිටියකු, මහල්ලකු වී මිය යයි, උපන් සිට වයසට ගොස් මිය යන තුරු නිරතුරුව ම සිදුවන මේ වෙනස හඳුන්වාදීමට ධර්මයේ භාවිත වන නම කුමක් ද?

(ii) බුදුරජාණන් වහන්සේගේ 'පුරිසදම්මසාරථි' ගුණය විස්තර කරමින් බුද්ධ චරිතය පසුබිම් කොට පොළොන්නරු යුගයේ ලියවුණු ගද්‍ය කෘතියෙහි නම හා එම කෘතිය රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

(iii) මම ජීවත්වනු කැමැත්තෙමි. සැප කැමැත්තෙමි. දුක් නොකැමැත්තෙමි. අන් සත්ත්වයින් ද එසේම වේ. මම අකමැති වන යම් පීඩාවක් අනුන්ට නො කර සිටිය යුතු ය. මෙසේ 'තමා උපමා කොට වරදින් වැළකීමේ ක්‍රමය' බුදු දහමේ හැඳින්වෙන්නේ කෙසේ ද?

(iv) පව් කිරීමට ඇති බිය හා ලැජ්ජාව ලෝවැස්සාගේ හැසිරීම පාලනය කරන කරුණු හෙවත් ලෝක පාලක ධර්ම ලෙස විස්තර කෙරේ. ධර්මයෙහි ඒ සඳහා යෙදෙන වචන **දෙක** ලියන්න.

(v) 'චරථ භික්ඛවෙ චාරිකං, බහුජන හිතාය බහුජන සුඛාය' මෙම පාඨයේ සරල අර්ථය ලියන්න.

(vi) යමෙක් වැරදි තීරණ ගැනීමට පොලඹවන අගතිගාමී විය හැකි කරුණු හතරක් ධර්මයේ ඉගැන්වේ. සතර අගති යනු ඒවා ය. එම කරුණු **හතර** ලියන්න.

(vii) 'වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බවත් මෛත්‍රියෙන් වෛරය සන්සිඳෙන බවත් එය සනාතන දහමක් බවත්' පැවසෙන ධම්මපද ගාථාව ලියන්න.

(viii) ධර්මාශෝක අධිරාජයා නවරට සසුන් පිහිටුවීමේ දී තම්බපණ්ණියට පිටත්කර යැවූ ධර්මදූත කණ්ඩායමේ නායකත්වය ඉසුලුයේ කවු ද? එහි දී මුලින් ම දේශනා කළ සූත්‍රය කුමක් ද?

(ix) ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය වන ගුණධර්ම හතරක් සතර සංග්‍රහ වස්තු ලෙස දැක්වේ. එම ගුණධර්ම **හතර** නම් කරන්න.

(x) තුරිත චාරිකා හා අතුරිත චාරිකා යන **දෙකෙහි** වෙනස පැහැදිලි කරන්න.

**2.** (i) පළමුවන හා දෙවන ථෙරවාදී බෞද්ධ ධර්ම සංගායනා පැවැත්වූ ස්ථාන නම් කරන්න.

(ii) එම ධර්ම සංගායනා දෙකෙහි ප්‍රධානත්වය ගෙන කටයුතු කළ මහරහතන් වහන්සේලාගේ හා දායකත්වය දැරූ රජවරුන්ගේ නම් වෙන වෙන ම ලියන්න.

(iii) තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ සම්බුද්ධ ශාසනයේ දේශාන්තර ව්‍යාප්තිය පිළිබඳ විස්තරයක් කරන්න.

[ හයවැනි පිටුව බලන්න.

**3.** "තෘණ හා වෘක්ෂලතා අතර ද, සිවුපාවුන්, පක්ෂීන්, කෘමීන්, උරගයන් හා මත්ස්‍යයන් යන සත්ත්ව කොට්ඨාශ අතර ද එකිනෙකාගේ වෙනස් ලක්ෂණ ඇත. මෙම සත්ත්ව හා ශාක අතර එකිනෙකට වෙනස් ජාති පවතී. සිවුපාවුන් අතර, සිංහ, ගව, මුව, ඌරු, බළල් ආදි විවිධ ජාති ඇත. පක්ෂීන් අතර ගිරා, මයිනා, සැළලිහිණි ආදී විවිධ ජාතීන් ද ඇත. එසේම තෘණ, වෘක්ෂලතා ආදියෙහිත් අනෙකුත් සත්ත්ව විශේෂ අතරත් ඔවුනොවුන් වෙන්කොට හඳුනා ගැනීම සඳහා සුවිශේෂ ලක්ෂණ ඇත. නමුත් මනුෂ්‍ය වර්ගයා අතර එකිනෙකා වෙන්නොට හඳුනාගත හැකි කිසිදු ශාරීරික ලක්ෂණයක් චර්යාත්මක ලක්ෂණයක් නොමැත."

(i) බුදුරජාණන් වහන්සේ විසින් ඉහත ආකාරයෙන් කරුණු පැහැදිලි කර දෙනු ලැබූ තරුණ බමුණන් **දෙදෙනාගේ** නම් ලියන්න.

(ii) මෙම දේශනාවෙන් ඉස්මතු කෙරෙන මූලික අදහස පහදන්න.

(iii) බුද්ධ දේශනාව අනුව මනුෂ්‍යයා උසස් හෝ පහත් හෝ වන්නේ ඔහුගේ ක්‍රියාවෙන් පමණක් බව පැහැදිලි කරන්න.

**4.** (i) පුද්ගලයකුගේ යසස වැඩීමට හේතුවන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ අදහස ලියන්න.

(iii) එම ධම්මපද ගාථාවෙන් ලබාදෙන ආදර්ශ, ශිෂ්‍ය ජීවිතය හැඩගස්වා ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

**5.** තරුණ ගොවි සමිති රැස්වීමක දී එහි සභාපතිතුමා මෙසේ පැවසී ය.

"අද අපි තරුණයන් විදියට ඉතාම දියුණු තත්ත්වයකට පත්වෙලයි ඉන්නෙ. අප තෝරාගත්ත ජීවන වෘත්තිය වූ කෘෂිකර්මය අපනට සරු අනාගතයකට මඟ පාදල තියෙනව. අද අප මෙහෙම මහ පොළොවෙ පය ගහල ඉන්නෙ පාසලේ දී ගුරුවරුන් අපට කියාදුන් දහම් බෞද්ධ ආර්ථිකය පිළිබඳ උපදෙස්වලට පින් සිදුවෙන්නයි. අද අපට අපේ දහඩිය මහන්සියෙන් ඉපයූ ධනය තියෙනවයි කියල ලොකු සතුටක් තියෙනව. ඒ වගේම අප මහන්සියෙන් හරිහම්බ කරපු ධනය විඳුම් කරන්නෙත් ධාර්මික දේටයි. අද අප ණය බරින් මිරිකිලා නොවෙයි ජීවත් වන්නේ. අපේ ජීවිත දිහා ආපහු හැරිල බැලුවම ලොකු සතුටක් ඇතිවෙනව, අප නිවැරදි ජීවිකාවක් ගෙවනව කියල, මට හිතෙනව බෞද්ධයන් හැටියට අපට තියෙන ලොකු ම සතුට මෙයයි කියල"

(i) තරුණ ගොවි සමිතියේ සභාපතිතුමා මෙම කරුණු ප්‍රකාශ කරන ලද්දේ කුමන සූත්‍රය ඇසුරෙන් ද?

(ii) මෙහි විස්තර කෙරෙන සුඛ (සැප) **හතර** නම් කරන්න.

(iii) බුදු දහමට අනුව ධනය ඉපයීම හා ධනය පරිභෝජනය කෙසේ සිදු කළ යුතුදැයි පහදන්න.

**6.** (i) දැහැමි පාලනයක් සඳහා ඉවහල් වන දසරාජධර්ම අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) ඉන් **එක්** කරුණක් සැකෙවින් හඳුන්වන්න.

(iii) සමෘද්ධිමත් රටක් බිහිකරලීමට අවශ්‍ය පදනම දසරාජධර්ම තුළින් සැකසෙන අයුරු පහදන්න.

**7.** (i) ස්තූප ගොඩනැංවීමේ දී අනුගමනය කෙරෙන මූලික ආකෘති හයෙන් **දෙකක්** නම් කරන්න.

(ii) මෙම ස්තූපයේ අංකනය කර ඇති කොටස් **තුන** නම් කරන්න.




(iii) ස්තූපයෙන්, ආධ්‍යාත්මික දියුණුව සංකේතවත් වන ආකාරය පැහැදිලි කරන්න.

❊ ❊ ❊